සුබස් සිතිවලි

ඉංගිරිසියේ 'හන්ඩ්‍රඩ් වේට්' (Hundred Weight) සිය බසට පැමිණ ඇත්තේ 'හොන්ඩර' යනුවෙනි. එක් වර ම එහි නඇකම නොපෙනුනත් සැලකිල්ලෙන් සිතා බැලූ විට හොන්ඩරය පැමිණ ඇත්තේ, ඉංගිරිසියේ 'හන්ඩ්‍රඩ් වේට්' යන්නෙන් බව අවබෝද වේ. ඇමරිකාවේ එය රාත්තල් 100 ක් වුවද මහා බ්‍රිතාන්‍යයේ දී එය රාත්තල් 112 කි. එය රාත්තල් 100 කිරීමේ තේරුමක් ඇති බව පෙනෙනත් ගනානුගතික වූ මහා බ්‍රිතාන්‍යය එය වෙනස් කලේ නැත. Check, Center, Meter වැනි වචන ඇමරිකාවට හොඳ වුවත්, Cheque, Center, Meter ම මහා බ්‍රිතාන්‍යය රැක ගෙන ඇත්තේ අපේ මුත්තා මැරෙන තෙක් කොන්ඩය බැන්ද විදියට ම ය.

'කාර්තුව' ද ඉංගිරිසියේ 'ක්වෝටර්' (Quarter) යන වචනයෙන් බිඳ ගත් සිංහල වචනයයි. දෙමලෙන් ගත් කාල (ක්) තියෙද්දී කාර්තුව (ක්) ගන්නේ අයේ ? පහනක් තියෙද්දි ලාම්පුවක් ගත් හේතුව ම මෙයට ද හේතු වී ඇති බව පෙනේ. පොල් තෙල් පහනත්, බීම් තෙල් ලාම්පුවත් ගැන සිතා බලන්න. හොන්ඩර කාර්තුව, අක්කර කාර්තුව අපට හුරු නැත.

ඉංගිරිසියේ 'එක (ර්)' පලමුවෙන් දෙමලටගිය බව පෙනේ. අක්කරෙරෙ යන්න අක්කර වී සිය බසට පැමිණ ඇත. එය කෙලින් ම ඉංගිරිසියෙන් ගන්නා නම් ඒකර, ඒකරු, එක්කර වැනි වචනයක් හැදෙන්නට ඉඩ තිබිනි. අක්කරෙරෙ පත්තු - මුනක්කරෙරෙ (මුනු - අක්කරෙරෙ) යන දෙමල නම් ගැන හිතන්න.

මුදුකඵල අපට 'මිදි' වුවත් දෙමලට එය 'මුද්දිර පලම්' විය. කොළඹ පදික වේදිකාවේ දමිල වෙලෙන්දන් මිදි විකුනුවේ 'මුද්දිරප්පලම් - මුද්දිරප්පලම්' කියා ය. එය ඇසුනු අපේ අයට මිදි අමතක විය. ඔවින් ද එය 'මුදුස්පලම්' යනුවෙන් ගත් බව පෙනේ.

'මෝල්' ද හොඳ වචනයකි. වී මෝල, ලීමෝල, ගල් මෝල, තෙල් මෝල අපට හිතර ඇසෙන පදයකි. යතුරකින් - මැසිමකින් එහි වැඩ කෙරෙන නිසා එය මෝලක් වී ඇත. වී කෙටීම, ලී ඉරීම, ගල් කැඩීම, තෙල් හිඳීම අපට අමුතු වැඩ නොවේ. හැබැයි අප ඒවා කෙලේ මැසිමකින් නො වේ.

වනේ ලා හෝ හමේ ලා අපි වී කෙටුවෙමු. වනේ ලා පොල්, (හිඳීම සඳහා), පිටි කෙටුවෙමු. එය කෙටුවේ 'මෝලෙනි'. 'මිල් ' යන්නට 'මෝල් ' ගත් කෙනාට අපේ මෝල සිහි වී ඇති බව පෙනේ. වචනයක් හදන්නේ / හැදෙන්නේ රැස්වීමක් පවත්වා සම්මත කර ගැනීමෙන් නො වේ ; එකකු කියූ දෙයක් තව එකකු කීම හෝ එකකු ලියූ දෙයක් තව එකකු ලිවීම නිසා ය.

මීටරය එන්නට පෙර අප රෙදි මැන්නේ යාර වලිනි. ඉංගිරිසියේ යාඩ් (Yard) බහාවර්ත පදයකි. ගේකට යාබද ව හෝ ගෙයක් වටා ඇති බිමත්, ඉම්රිය පාරේ ඉස්ටේසමට යාබද ඉඩමත්, අඟල් 36 ක දිගත් (තවත් තේරුම් ඇත) යාඩ් (Yard) එකකි. ඒ යාඩ් (Yard) සිය බසට බිඳී ආවේ 'යාර' කියායි. එහෙත් අපේ 'යාරය' අඟල් 36 ක දිග මිස වෙනත් තේරුමක් ඇතිව වියහර නොවේ.

අලුත් වචනයක් දුටුවිට - ඇසුනු විට සමහරු 'කුලප්පු' වෙති. ලංකාවේ වාහනවලට "ශ්‍රී" අකුර යෙදීමට එරෙහි වුවත් එදා කීවේ නොමිමර තහඩුවේ මඩ - ගොහොදු - ජරාව නඇවෙන - ගඇවෙන ගෙයින් "ශ්‍රී" අකුරේ ඇති (ශුද්ද වූ) තේජස එයින් නැති වන බවයි. එය ආවේ පන්සලෙනි.

එසේ ම ප්‍රින්ටිං ප්‍රෙස් (Printing Press) යන්නට මුහිදාස පඬි තුමා දුන් 'පහරවෙ - පහරන' යන වචන නොරිසි වුවන්ට මල - මල පහ කිරීම - පැහැරීම සිහි වී එයට ද තප්පු ලෑ හැටි මෙහි දී මතක් වෙයි. ඉංගිරිසි දිස්තරියේ 'ප්‍රෙස් ' (Press) යන්න තේරුම් කර ඇති විදිය අනුව (Press) ප්‍රෙස් යන්නට දිය හැකි හොඳ ම වචනය 'පහරවෙ - පහරනවා - පැහැරුවා' ය. එසේ තප්පු ලෑවුන් විසින් කල යුතුව තිබුනේ - මුද්‍රනාලය මුද්‍රනය කරනවා යන ගොරහැඩි, කතා බහට ගත නොහැකි වචන වෙනුවට අලුත් වචනයක් නිර්මානය කිරීමයි. එය තත්සම වචනයක් හෝ තිශ්පන්න වචනයක් විය හැකිය.

"විජය මුද්‍රනාලයයේ මුද්‍රනය කරන ලදි හා විජය පහරුවේ පැහැරුවිනි." යන වැකකි දෙකේ වෙනස ගැන සිතා බලන්න.

අපේ බස ලොවේ ඉහල තැනක වැජඹෙන බසක් යැයි කියනවාට වඩා (මගේ එක හොඳ ම එක) එයට අලුත් වචන හදා ගන්නා ක්‍රමයක් ගැන හෝ අලුත් වචන ඇද ගන්නා ක්‍රමයක් ගැන සිතීම හොඳ නේ ද ?

කාල පරාසය, (සෙල) සයිල බිත්තිය හොඳ නිර්මාන බව පෙනේ. මීටර්, ලිටර්, ග්‍රෑම්, ඩිරෑම් (ග්‍රෑම්, ඩ්‍රෑම් කියවිය යුත්තේ 'ධ්‍රවය මෙන්, ග්‍රෑම් ඩිරෑම් කියායි) ඒ විදියට ම ගන්නවා ද , නො එසේ නම් අලුත් වචන හදා ගන්නවාද යන්න උගතුන්ගේ ඔලුවල පහල විය යුතු අදහසකි.

හෙමින් යනවා, හෙමින් දොඩනවා යන්නේ හෙමින් යන වචනයේ තේරුම් දෙකකි. ඉංගිරිසියේ (Slowly Softly) ස්ලෝ ලි - සොෆ්ට් ලි යනුවෙන් ඒ සඳහා වචන දෙකකි.

(මෙහි සාගය, හෝග, සෝර, ඝෝෂාව වැනි වචන ලියා ඇත්තේ බාගය, බෝග, ගෝර, ගෝෂාව මෙන් අල්ප ප්‍රාන අකුරු ඉදිරියේ කොමාවක් යෙදීමෙනි. යතුරු පුවරුවේ ද එය ඇති හෙයින් ගැටලුවක් ඇති නොවේ. මෙය අත් හදා බැලීමකි. ණ, ළ, ෂ අකුරු වෙනුවට ඩන්තජ, තාලුජ අකුරු මා ලියන බව ඔබ දනිති.)

එක් සීය - දෙක් සීය - තුන් සීය

එකේ සිට දහය දක්වා ඇති (සංඛ්‍යා) නාම පදවල ශබ්ද වන්නේ "එක් - දෙ - තුන් - හතර (සිව්) - පස් - ස - සත් - අට - නව - දහ" යි. එය එක් + අ = එක - තුන් + අ = තුන සහ එක් + ඒ = එකේ - තුන් + ඒ = තුනේ යනුවෙන් දහය දක්වා වරගැගේ.

දහස් ශබ්දය එක් දහස, දෙ - දහස, තුන් දහස, සතර (හාර) දහස, අට දහස යනුවෙනි, වියහාර වන්නේ.

එයින් එක් - තුන් - පස් - සත් යන ශබ්ද හතරට අ - ඒ යන ප්‍රත්‍යය එකතු වූ පසු එක/එකේ - තුන/තුනේ - පස/පසේ (පහ/පහේ) - සත/සතේ (හත/හතේ) යන නාම පද සෑදේ. ස - නව යන ශබ්ද දෙකට ප්‍රත්‍යය එකතු වන්නේ 'යි 'යන්නක් පෙරටු කර ගෙනය. ස + යි + අ = සය, නව + යි + අ = නවය විදියටයි.

හතර - අට යන ශබ්ද දෙක 'හතරය - අටය' නොවේ. එකතු වන ප්‍රත්‍යයවලට ඉඩ සලසා "සතර් - අට් වෙනවා ද, එකතු වූ සැනින් ඒ ප්‍රත්‍යය අහෝසි වෙනවා ද යනු ස්තිර වශයෙන් කිව නොහැකි නමුත් සතර් + අ, සතර් + එන්, සතර් + ඒ, සතර් + අට, සතර් + අක් යන වියහර අනුව 'සතර් - අට' වන බව නිගමනය කල යුතුය. එබඳු ශබ්ද සිය බසේ ඇත. ඇඟ - කර - කට යන ශබ්ද ඇඟය - කරය - කටය නො වේ.

"විජය කුමරා කගය අතට ගෙන" යන රාජාවලි වාක්‍යය තිලොස් විය නොහැක - ඇඟයෙන් ඇටයක් යන්නා සේ - කරයට ගොඩ වන්නා සේ - කටයට ගසන්නා සේ යන තැන් බලා තේරුම් ගන්න.

"දෙ" ශබ්දයට "අ" එකතු වන්නේ "ය් " යන්නක් සමග නොව "ක් " යන ඇරුම පුදුම අකුරක් සමගයි. "ක් " යන්න (ආගම) එකතුවන වෙනත් ශබ්දයක් ගැන මට තිව්වියක් නැත. එක දෙස බලා දෙක සාදා ගත නොහැකි වන්නේ එක් + අ = එක වන නිසා ය.

"දෙක් " යනුවෙන් ශබ්දයක් සිය බසේ නැත. ගෙ + අ = ගෙය - ලේ + අ = ලෙය - මෙ + අ = මෙය හා සැසඳූ විට එය හොඳින් පැහැදිලි වේ. "එක් දහසක්" ඇතත් "දෙක් දහසක් " නැත.

"නීති විරෝධ වූ ශබ්ද සංයෝජනයක් වේ ද ඒ නෛරුක්තික විදි නම් නෛරුක්තිකයෝ නම් ව්‍යාකරන කාරයෝය..... නීතියක් දැක්විය නොහැකි කල..... එය නෛරුක්තික විදියෙන් වූයේ යැයි කියති. නෛරුක්තිකයන්ට පිහිට පිහිස වූ හෙයින් නෛරුක්තික විදි.... (කුමාරතුංග)

මේ නීතිය වලංගු වන්නේ දැනට හැඳි ඇති වචන වලට පමනක් දැයි නොදනිමි. ලියමනේ දී වචනයක් වරදක්, ව්‍යාකරන දෝසයක් සිදු වූ විට මෙය නිදහසට කාරනයක් විය හැකිය. පාන්ඩුකම්බල (ශෛලාසනය) සිය බසට පැමිණ ඇත්තේ "පඩු ඇඹුල" කියායි. ඒ නෛරුක්තික විදිය ලු. පන් සිය, සසිය, සත්සිය විය යුතු වුවත් "හය සිය" ද එබඳු වචනයකි.

අපේ අම්මා අකාරාදියක් ගැන හෝ ශබ්ද කෝසයක් ගැන නො දනී. ඇය "අන්න මාම දිස්තරිය/දිස්නේරිය ඉල්ලනව." කියන්නේ "ඉංගිරිසි ඩික්ශනරියට" යි. උගතුන්ගේ "අකාර + ආදියට" වඩා අම්මාගේ දිස්තරිය මම අගය කරමි.

"හන්ඩ්‍රඩ් වේට් - හොන්ඩර, යාඩ් - යාර" වී ඇතත් එයට සිනාසෙන කෙනෙකු මා දැක නැත.

australian consumer law

මාධ්‍ය නිවේදනය

නිවාඩු වෙන්කරන විට ඔබ ආරක්ෂාකාරී ආකාරයට කටයුතු කරන ලෙස ඕස්ට්‍රේලියානු රජය කියා සිටී.

ඕස්ට්‍රේලියානු පාරිභෝගිකයන් සිය ගමන් සහ නිවාඩු වෙන්කරන අවස්ථාවල තමාව ආරක්ෂා කර ගැනීමට ගත හැකි සරල පියවර කිහිපයක් ඕස්ට්‍රේලියානු පාරිභෝගික ආරක්ෂණ ඒජන්සිය මගින් දියත් කල නව ව්‍යාපාරය මගින් ගමන් කිරීමට බලාපොරොත්තුවන අය හට මතක් කරදේ.

වික්ටෝරියා පාරිභෝගික කටයුතු (Consumer Affairs Victoria) සම්බන්ධ අධ්‍යක්ෂක වන ආචාර්ය ක්ලෙයාර් නූන් (Claire Noone) පවසන ආකාරයට අධික තරඟය සහ මාර්ගගතව කරන වෙන්කර ගැනීම් ප්‍රමාණයේ වර්ධනය සමඟින් මිනිසුන් විසින් සිය ගමන් සැලසුම් කරන සහ එවා මිළට ගන්නා ආකාරය වෙනස්වී ඇත. "සමහර අය හට නිවාඩුවක් වෙන්කර ගැනීම ඉතා ඉක්මන් සහ සරල ක්‍රියාවලියක් විය හැකි අතර, සමහර අයහට සිය ගමන සැලසුම් කර ගැනීමට බොහෝ කාලයක් සහ ශ්‍රමයක් වැය කරනු ඇත."

"ඕස්ට්‍රේලියානුවන් සංචාරය කිරීමට කැමති බව අප දන්නා අතර, බොහෝ අය සිය පවුලේ අය සහ මිතුරන් බැලීමට සිය මව් රටට යනු ඇත," යන්න ආචාර්ය නූන් (Noone) පවසයි.

සංඛ්‍යාලේඛණ මගින් පෙන්වා දෙන්නේ පසගිය වසර තුල ඕස්ට්‍රේලියානුවන් විසින් විදේශ සංචාර මිලයන හමයකට සහභාගිවූ බවයි.

"නිවාඩුවක් සම්බන්ධනේ අධික ලෙස උනන්දුවක් තිබීම ඉතා පහසුවෙන් සිදුවිය හැකි වුවද ඔබ විසින් මිළට ගන්නා දෙය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පූර්වෝපායන් ගැනීම අමතක විය හැකිය. "

ආචාර්ය නූන් (Noone) පවසන ආකාරයට ඕස්ට්‍රේලියානු පාරිභෝගික නීතිය (Australian Consumer Law) යටතේ පාරිභෝගිකයන් හට ඇති ආරක්ෂණවලට අමතරව, තමා විසින් මිළට ගන්නා දෙය ආරක්ෂා කිරීම සඳහා සරල පියවර ඔවුන් විසින් ලබාගත හැකිය.

"ඔබගේ නිවාඩුව ඉතා විශිෂ්ඨ එකක් වන බවට වගබලා ගැනීම සඳහා කීර්තිය සහ පාරිභෝගික සේවාව සරල මාර්ගවේ," යන්න ආචාර්ය නූන් (Noone) පවසයි.

"සමාලෝචන දෙස බලන්න. එසේම, ඔබගේ ප්‍රජාව තුල සිටින පවුලේ අය, මිතුරන් සහ අනෙක් අයගේ නිර්දේශ ලබා ගන්න. ඔබ සංචාරක නියෝජිතයෙකු ඔස්සේ වෙන්කරවා ගැනීම කරන්නේ නම්, ඔවුන් හට පිළිගැනීම ඇතිද යන්න පරීක්ෂා කර බලන්න. පුද්ගලිකව ගොස් හෝ මාර්ගගතව, ඔබ වෙත කිරීම කරන ව්‍යාපාරය, පැහැදිලිව නැවත මුදල් ලබාදීම සහ පැමිණිලි කිරීම ප්‍රතිපත්ති පැහැදිලිව දක්වා තිබිය යුතුය. "

පාරිභෝගිකයන් විසින් තමා මිළදී ගන්නා දෙයට ගෙවන ආකාරය නිසි ලෙස තොරා ගැනීම මගින් ආරක්ෂාකාරී විය හැකිය.

"ඔබ මිලට ගන්නා දේවලට ක්‍රෙඩිට් කාඩ් මගින් ගෙවීම වඩා වියදම් අධික ක්‍රමයක් විය හැකිය. කෙසේ වුවද, තමා විසින් ගෙවීමක් කර වෙන්කර ගැනීමක් කල පසු තමා ගෙවන ලද දෙය ලැබුණේ නැතිනම් ඔවුන්ගේ බැංකුවෙන් මුදල් නැවත ලබාගැනීමට හැකිවීම මගින් යම් ආරක්ෂාවක් ලබාදේ."

පාරිභෝගිකයන් විසින් ක්‍රෙඩිට් කාඩයක් භාවිතා කර හෝ මාස්ටර්කාඩ් හෝ වීසා ඩෙබිට් කාඩ් පත් භාවිතා කර 'ක්‍රෙඩිට්' යනුවෙන් තොරා ගෙවීමක් කලහොත් සිය බැංකුව මගින් එම ගෙවීම නැවත හරවන ලෙස ඉල්ලා සිටිය හැකිය. කෙසේ වුවද, ඩෙබිට් කාඩ් භාවිතා කර, 'වෙක්' හෝ 'ස්වින්ගස්' භාවිතා කර ගෙවීම කලහොත් හෝ මුදල්, වෙක්පත්, මුදල් හුවමාරු කිරීම, කෙළින්ම මුදල් යැවීම හෝ ඩීජේ භාවිතා කර ගෙවීමක් කලහොත් එවා නැවත ලබාගත නොහැකිවේ.

නිවාඩු යන අය සංචාරය කරන අතරතුර පූර්ණ සංචාරක රක්ෂණ ආවරණයක් ලබාගන්නා ලෙස ඉතා ඉහළින් උනන්දු කෙරේ. තවද කුමන අවස්ථා සහ ක්‍රියාකාරකම් එම රක්ෂණ ආවරණය මගින් ආවරණය නොවේද යන්න පරීක්ෂාකර බැලිය යුතුය.

ඔබගේ මීළඟ නිවාඩුව වඩා ආරක්ෂාකාරී ලෙස වෙන්කරවා ගන්නේද යන්න සම්බන්ධ වැඩිපුර හොඳුවාවන් සහ තොරතුරු සඳහා කරුණාකර www.packsomepeaceofmind.gov.au වෙබ් අඩවිය වෙත යන්න.